## දික්වැල්ල ප්‍රාදේශීය සභාව.
## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 පෙබරවාරි 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා ඉදිරිපත් කර තිබූ උපලේඛණ අතර රු.827,928 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයට මධ්‍යම රජයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු බිල් කිරීම් රු.443,932 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැර තිබුණි.

(ඇ) විගණන ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව, පොදු ගබඩා වටිනාකම රු.90,533 ක් වුවද ගබඩා ලෙජරය අනුව වටිනාකම (පොදු ද්‍රව්‍ය හා වීථි පහන්) රු.88,709 ක් වූයෙන් වෙනස රු.1,824 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ කඩ කාමර බදුදීමේදී ලැබුණ රු.4,082,580 ක එක්වන් මුදල් (Key money) වර්ෂයේ ආදායමට නොගෙන ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙසට දක්වා තිබුණි.

(ඊ) (i) සමාලෝචිත වර්ෂයේ බැංකු ගිණුම් දෙකකට අදාල බැංකු සැසඳුම් අනුව දැක්වෙන වටිනාකමත් මූල්‍ය ප්‍රකාශන අනුව දැක්වෙන වටිනාකමත් අතර රු.120,000 ක වෙනසක් විය.

(ii) අංක 414 බැංකු ගිණුමට අදාල 2010 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගෙවිය යුතු ගිණුම්

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.30,606,353 ක් විය.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.2,194,594 ක දායක මුදල මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

ගිණුම් විෂයයන් 07 කට අයත් රු.196,409,511 ක් වටිනා ශේෂයන් සඳහා ස්ථාවර වත්කම් ලේඛණ, අයිතිය හා පැවැත්ම තහවුරු කෙරෙන ලිපිලේඛණ, උපලේඛණ, කාල විශ්ලේෂණ ආදිය නොමැතිකමින් එකී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය ශේෂය සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණය කර නොතිබුණි. |
| (ආ) 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකරන 4% ක පොලී අනුපාතිකය අතර වෙනස රජය විසින් දැරිය යුතු වුවත් ඉකුත් වර්ෂ 02 ක සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.233,908 ක් සභාවට අයවිය යුතුව තිබුණද එය අයකරගෙන නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,845,706 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,429,531 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ආදායම් හා වෙනත් ලැබීම් ඇතුළු හිඟ ආදායම් පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | 2010 | 2009 | | |
| | රු.'000 | රු.'000 | | % |
| වරිපනම් | 1,223 | 1,049 | 16.5 | - |
| අක්කර බදු | 25 | 20 | 25.0 | - |
| බලපත්‍ර ගාස්තු | 471 | 341 | 38.1 | - |
| කුලී මුදල් | 962 | 887 | 8.5 | - |
| විනෝද බදු | 40 | 49 | - | 18.3 |
| වෙනත් | 39,455 | 27,318 | 44.42 | - |

විගණනය වෙත සපයන ලද තොරතුරු අනුව සභාවේ පහත සඳහන් ආදායම් අයවීමේ ප්‍රගතිය දුර්වල තත්ත්වයක විය.

| ආදායම | 2010.01.01 දිනට හිඟය | 2010 වර්ෂය බිල්කල මුදල | අයවිය යුතු මුළු මුදල | අයවී තිබූ මුදල |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 1,048,746 | 1,480,955 | 2,529,701 | 1,306,311 |
| බදු කුලී | 218,690 | 901,687 | 1,120,377 | 781,588 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 340,714 | 981,502 | 1,322,216 | 851,691 |

### 2.2.1 උසාවි දඩ මුදල

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ වලින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.185,125 දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.2 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.27,620,042 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 හිඟ ආදායම් අයකිරීම.

සමාලෝචිත හා ඉකුත් වර්ෂවලට අදාල රු.1,509,980 ක අයවිය යුතු ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 බස් නැවතුම්පල කඩකාමර බදු.

බිම් මහලේ කඩ කාමර 5 ක් මසකට රු. 500 බැගින්ද, ඉහල මහලේ කඩ කාමර 13 ක් මසකට රු.800 බැගින්ද බදු දීමට 2010 මැයි 01 දින ගිවිසුම් අත්සන් කර තිබුණි.

(i) ගිවිසුමේ පළමු කොන්දේසිය අනුව නියමිත බදු මුදල් සෑම මසකම 25 දිනට පෙර ගෙවිය යුතු වුවත් කඩ කාමර 08 කින් 2011 ජූනි 13 දිනට රු.75,620 ක මුදලක් හිඟ හිට තිබුණි.

(ii) ගවිසුමේ තෙවන කොන්දේසිය අනුව එක් මාසයකට වඩා වැඩි කාලයක් ගෙවීම් පැහැර හැරියහොත් එකී බද්ද අවලංගු වන අතර ඇප මුදලද බදු දීමනාකාර පක්ෂය සතුකරගත යුතු වුවත් ඉහත කඩ කාමර සඳහා එසේ කටයුතු කර නොතිබුණි.

(iii) ගිවිසුමේ 8 වන සහ 9 වන වගන්ති අනුව වෙළඳ ස්ථානය වසා තැබීමට නොහැකි බවත් මොනම හේතුවක් නිසාවත් හේතු රහිතව වසා තැබීම නොකල යුතු බවත්, එසේ වසා තබන්නේ නම් ගිවිසුම අවලංගු වී නැවත එම ස්ථානයේ අයිතිය සභාව සතු වන බවත්, දක්වා තිබුණද 2011 මැයි 20 වන දින කරන ලද භෞතික පරීක්ෂාවේදී බිම් මහලේ කඩ කාමර තුනක්ද, ඉහල මාලයේ සියළුම කඩ කාමරද වසා තිබූ බව නිරීක්ෂණය විය.

(iv) ගිවිසුමේ 4 වන වගන්තිය අනුව කඩ කාමරය පිහිටි බිමේ පිටතට සිටින සේ කවර ආකාරයක හෝ ආවරණයක් , පැලැල්ලක්, මැස්සක් හෝ වෙනත් අනවසර ඉදිකිරීමක් නොකල යුතු බවට දක්වා තිබුණද කඩ කාමර අංක 02 හි පිටතට සිටින සේ ඉදිකිරීමක් කර තිබුණි.

2.2.5 පොදු වෙළඳ පොල කඩ කාමර බදු

පොදු වෙළඳ පොලේ කඩ කාමර 11ක් සඳහා රු.1,000 බැගින්ද, කඩ කාමර 11 ක් සඳහා රු.750 බැගින්ද මාසික බද්දක් අයකර ගැනීම සඳහා 2010 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර තිබුණි.

(i) ගිවිසුමේ අංක 02 සහ 03 වන වගන්ති අනුව කඩ කාමර සඳහා මාසික බද්ද එක් මාසයකට වඩා වැඩි කාල සීමාවක් නොගෙවා සිටියහොත් බද්ද අවලංගු වන බව දක්වා තිබුණද කඩ කාමර 07 කින් 2011 ජූනි 13 දිනට රු.321,370 ක් අයකර නොතිබුණි.

(ii) කඩ කාමර බදුදී තිබූ බදුකරුවන් විසින් ගිවිසුමට පටහැනිව කඩ කාමර දෙකක් අතුරු බදුදී ඇති බව 2011 මැයි 20 වන දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර අතුරු බදුකරුවන් රු.4,000, රු.4,500 ක් තරම් ඉහල මාසික කුලියක් මුල් බදුකරුවන්ට ගෙවා තිබූ බව විගණනයට වාර්තා විය.

(iii) ගිවිසුම අනුව කඩ කාමර වසා තැබීම සිදු නොකල යුතු නමුත් අංක 5,7,8,10 දරණ කඩ කාමර වසා දමා ඇති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iv) පොදු වෙළඳ පොල කඩ අල්ලි 26 ක් රු.250 බැගින් වූ මාසික කුලියකට බදුදී තිබූ නමුත් අංක 10 සිට අංක 21 දක්වා සියළුම කඩ කාමර භාවිතයකින් තොරව වසා දමා තිබුණෙන් වෙළඳ පොල ඉදිකිරීම සඳහා සභාව වැය කල මුදල මහජන යහපතෙහි යෙදවී නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

2.2.6 ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය, ගාස්තු

සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් 1988 අගෝස්තු 23 දින අංක 520/7 දරණ පළාත් පාලන ගැසට් පත්‍රයේ අතුරු ව්‍යවස්ථානුකුලව 2010 ජනවාරි 28 දිනැති අංක 1639 දරන ගැසට් පත්‍රය මගින් ගාස්තු පනවා අයකිරීමට තීරණය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(අ) සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් සම්බන්ධයෙන් සභාවේ ආදායම් පරීක්ෂකවරයා සමඟ 2011 මැයි 19 දිනැතිව සිදුකල භෞතික පරීක්ෂාවේදී මහා මාර්ගයේ සවිකර තිබුණු ප්‍රචාරක දැන්වීම් 44 කින් රු.118,050 ක ගාස්තු 2011 මැයි 19 දින වන විට අයවී නොතිබූ අතර එම දැන්වීම් 2010 වර්ෂයේ සිට ප්‍රදර්ශනය වෙමින් පවතින ඒවා බවද නිරීක්ෂණය විය.

(ආ) සභාව විසින් ගැසට් පත්‍රයේ පරිදි ගොඩනැගිල්ලේ, ව්‍යාපාරික ස්ථානයේ/වහලයේ ප්‍රදර්ශනය වෙමින් පවතින ප්‍රචාරක දැන්වීම්, වලින් හා බිත්තියක ප්‍රදර්ශනය වෙමින් පවතින දැන්වීම් වලින් ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) භෞතික පරීක්ෂාවට භාජනය වූයේ සභා බල ප්‍රදේශයේ (මාතර-තංගල්ල) ප්‍රධාන මාර්ගයේ ඉතා සීමිත ප්‍රදේශයකි. එහෙයින් සමස්ථ බල ප්‍රදේශයේම පදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීම් වලින් නිවැරදිව ගාස්තු අය නොකිරීම මත සභාවට මූල්‍යමය පාඩුවක් සිදුවී ඇති බවද නිරීක්ෂණය විය.

2.2.7 බදු හා ගාස්තු

ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් බදු හා ගාස්තු අයකිරීමට ප්‍රාදේශීය සභා පනතේ වගන්තින් දක්වමින් 2010 ජනවාරි 28 දිනැති අංක 1639 දරන ගැසට් පත්‍රයෙන් නියම කර තිබුණද එකී බදු හා ගාස්තු අයවූ බවට තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණ.

(අ) ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශයේ ඉඩම්, වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන විට විකිණීමෙන් ලබන මුදලින් 1% ක බද්දක් අයකරගත යුතුවිය.

2011 මැයි 19 විගණන පරීක්ෂණ අවස්ථාව වන විටද සභා බල ප්‍රදේශයේ විජිත මහා විදුහලට ආසන්න වික්ටර් ගාර්ඩින් ඉඩම, දෙල්ගල්ල මංසන්ධියේ ක්‍රවුන් සිටි ඉඩම වෙන්දේසියේ විකිණෙමින් තිබුණද, ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 60 පරිදි පී.එස්. 26 ආකෘතියේ ලේඛණයක් පවත්වා නොතිබුණෙන් බදු අයවීම් විස්තර අනාවරණය නොවීය.

(ආ) ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශයේ බැංකු රක්ෂණ නියෝජිතයන්, සංචාරක හෝටලකරුවන්/ගෙස්ට්හවුස්කරුවන්, උත්සව ශාලාකරුවන්, රේස් ඔට්ටු හල්, පුද්ගලික පන්ති පවත්වන්නවුන්, රටබීම හා බීර සාප්පු පවත්වාගෙන යන්නන්, මෝටර් රථ අමතර කොටස් වෙළදාම් කරුවන්ගෙන්, බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ ව්‍යාපාර ලැබීම් වලට අනුකූලව 1% ක බද්දක් අයකර ගෙන නොතිබුණි.

2.2.8 දුරකථන/විදුලි සංදේශ කුළුණු සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීම.

නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2008 දෙසැම්බර් 16 දිනැති අංක 5/02/01/384 දරණ ලිපියේ 7 ඡේදය පරිදි සභා බල ප්‍රදේශයේ දැනට භාවිතා කරමින් තිබෙන දුරකථන/විදුලි සංදේශ කුළුණු 07 කින් අනුකූලතා සහතික නිකුත් කිරීම වෙනුවෙන් රු.36,000 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 18,128 | 17,219 | 909 | 16,863 | 4,906 | 11,957 |
| අනෙකුත් | 10,650 | 15,833 | (5,183) | 9,830 | 2,553 | 7,277 |
| උප එකතුව | 28,778 | 33,052 | (4,274) | 26,693 | 7,459 | 19,234 |
| ප්‍රාග්ධන වියදම | 118,485 | 121,607 | (3,122) | 89,920 | 44,633 | 45,287 |
| මුළු එකතුව | 147,263 | 154,659 | (7,396) | 116,613 | 52,092 | 64,521 |

2.4 මානව සම්පත් කළමනාකරණය.

අනුමත සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 03 | 04 |
| ද්විතියික | 18 | 19 |
| ප්‍රාථමික | 31 | 20 |
| වෙනත් (අනියම්, තාවකාලික) | 04 | 33 |

56 76

(අ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත්‍ර දීමනා ලෙස රු.15,047,000 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් වියදම රු. 16,907,457 ක් වූයෙන් සභාවට රු.1,860,457 ක අතිරේක වැය බරක් සිදු වී තිබුණි.

(ආ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කාර්ය මණඩලය තුල ප්‍රජා සංවර්ධන නිලධාරියෙකුගේ, සහ සංවර්ධන සහකාරවරුන් තිදෙනෙකුගේ අතිරික්තයක් විය. තවද භාණ්ඩගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති අංක 14 හා 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතනවලට අනියම්, තාවකාලික සේවකයන් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධානයට පටහැනිව සේවකයන් 29 ක් බඳවාගෙන වැටුප් වශයෙන් සභා අරමුදලින් රු.1,841,319 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකල හොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය.

### 2.5.1 ලැබිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 42,176,369 ක් විය.

### 2.5.2 අයවීමට ඇති සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,294,911 ක් විය.

### 2.5.3 භාණ්ඩ සමීක්ෂණය.

2008 හා 2009 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මගින් කරන ලද පහත දැක්වෙන නිර්දේශයන් 2010 වර්ෂයේදීද සිදුකර තිබූ අතර 2011 මැයි 19 දින වන විටද එම නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

(i) දික්වැල්ල, කෝට්ටේගොඩ, නිල්වැල්ල, රදම්පල, පෙර පාසල් වලද, දික්වැල්ල කුමාරතුංග මුනිදාස, රත්මලේ පුස්තකාල වලද, පොදුසේවා සංවර්ධන ව්‍යාපෘතිය, රත්මලේ උප කාර්යාල වල තොග ලේඛණ නිසි පරිදි පවත්වාගෙන යාම.

(ii) ප්‍රාදේශීය සභාව හා ඒ යටතේ පවතින ආයතනයන්හි භාණ්ඩ නිශ්චිතව හඳුනා ගත හැකි පරිදි සංකේතකරණය කිරීම.

(iii) ප්‍රධාන කාර්යාලයේ ගබඩාව සඳහා නිශ්චිත ස්ථානයක් ලබාදීම හා භාණ්ඩ හා උපකරණ වර්ග 6 කට අදාල භාණ්ඩ 30 ක ඌණතාවය සම්බන්ධයෙන් පියවර ගැනීම.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 2.6.1 වීථි පහන් නඩත්තුව

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විදුලි උපාංග මිලදී ගැනීමේදී අවශ්‍යතාවය පරදි නඩත්තු විදුලි කාර්මිකගේ ඉල්ලීම හා ඒ සඳහා කාර්මික නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) සභා බල ප්‍රදේශය තුල නඩත්තුව සිදුවන වීථි පහන් එකිනෙක වෙන්කොට හඳුනාගැනීම සඳහා අංක හෝ සංකේත ක්‍රමයක් භාවිතා කරමින් එක් එක් වීථි පහන සඳහා විදුලි බුබුළු හා අනෙකුත් උපාංග සවි කිරීමේදී සවිකල දින වකවානු, වෙළඳනාම පිළිබඳ සලකුණු, හා වෝල්ටීයතාවය හඳුනාගැනීමේ සංකේත අංක ආදිය ඇතුලත් කරමින් ලේඛණයක් පවත්වා නොතිබුණි.

(iii) 2010 වර්ෂය සඳහා ලංකා විදුලි බල මණ්ඩලයෙන් අනුමත වීථි පහන් සංඛ්‍යාව 186 ක් වුවද සභාව විසින් 2011 ජුනි 13 දක්වා සවිකර තිබූ වීථි පහන් සංඛ්‍යාව 308 ක් විය. ලංකා විදුලි බල මණ්ඩලයෙන් මාසයකට රු.11,262 බැගින් සමාලෝචිත වර්ෂය සඳහා රු.135,144 ක් ඉල්ලුම්කර තිබුණද, විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වී තිබුණේ ඉන් රු.81,980 ක් පමණි. එහෙත් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ඉහත වීථි පහන් නඩත්තුව සඳහා සභා අරමුදලින් රු.215,122 ක් වැය කර තිබුණෙන් සභා අරමුදලට රු. 133,142 ක අතිරේක වැය බරක් දැරීමට සිදුවී තිබුණි.

## 2.7 කොන්ත්‍රාත් පාලනය.

### 2.7.1 බෝදර වේල්ල පාර කොන්ක්‍රීට් කිරීම

මෙම කර්මාන්තය සඳහා බතීගම බටහිර සමෘද්ධි සමිතිය සමඟ 2010 අප්‍රේල් 20 දින රු.387,040 ක් වටිනා ගිවිසුමක් අත්සන් කර රු.379,164 ක් ගෙවීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඇස්තමේන්තුවේ හෝ ගිවිසුමේ තොරතුරු වලින් ඉදිකිරීමට යෝජිත මාර්ග කොටසේ ආරම්භක ස්ථානය හා අවසාන ස්ථානය නිශ්චිත ලෙස පෙන්වන සැලැස්මක් නොතිබුණි.

(ආ) ඇස්තමේන්තුවේ අයිතම අංක 7 මාර්ගය දෙපස පස් දමා උරහිස් පිරවීම විෂයය විගණිත උන වූ 2011 මැයි 18 දින වන විටද ඉටුකර නොතිබූ අතර එකී විෂයය සඳහා රු.6,685 ක් ගෙවා තිබුණි.

(ඇ) 2010 අප්‍රේල් 29 දිනට වැඩ අවසන් කළ යුතු මෙම කර්මාන්තයේ අංක 7 විෂයය ඉටුකර නොතිබියදී 2011 මැයි 13 වෙනි දින මාර්ගයේ වැඩ නිමකලා සේ සලකා කොන්ත්‍රාත් සමිතිය වෙත 10% රැඳවුම් මුදල්ද නිදහස් කර ගෙවා තිබුණි.

## 2.8 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) ස්ථාවර වත්කම්

(ඈ) ගබඩා පාලනය